කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගම - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගමේ (“සමාගම”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභා හා අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.5.1 ලැබිය යුතු ගිණුම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට රු.92,048,582 ක වෙළඳ ලැබිය යුතු මුදල් වලින් රු.46,325,918 ක් හෙවත් සියයට 50 ක් දින 360 කට වඩා වැඩි කාලයක් හිඟව පැවතුනි. ඊට අමතරව, අක්‍රිය කුලී නිවැසියන්ගෙන් ලැබිය යුතු මුදල් එකතුව රු.48,493,421 න් රු.46,986,804 ක් දින 90 කට වඩා වැඩි කාලයක් හිඟව පැවතුනි.	අක්‍රිය කුලී නිවැසියන්ට අදාළ රු.46,989,004 ක හිඟ ශේෂය අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු සිදු වෙමින් පවතී. කිසිදු කුලී නිවැසියෙකුට තම ආරක්ෂක තැන්පතුවෙන් සියයට 90 ඉක්මවන හිඟ ශේෂයන් ඉක්මවා යාමට අවසර නොදෙන බව සහතික කිරීම සඳහා සමාගම පාලනයන් ශක්තිමත් කර ඇත.	දින 360 කට වඩා කල් ඉකුත් වූ ලැබිය යුතු මුදල් හොඳින් නිරීක්ෂණය කර සමාලෝචනය කරන්න.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.366,647,917 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.125,700,809 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.240,947,108 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයෝජන දේපළවල සාධාරණ වටිනාකම රු.269,517,245 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පසුගිය වසර පහ සඳහා ආදායම, පරිපාලන වියදම් සහ ශුද්ධ ලාභය / (අලාභය) විචලනයන් සමඟ විශ්ලේෂණය කිරීම සහ වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය පහත පරිදි වේ.

මූල්‍ය ප්‍රකාශන අයිතමයන්	2024	2023	2022	2021	2020	වර්ධනය / පිරිහීම 2023-2024	
	Rs.000	Rs.000	Rs.000	Rs.000	Rs.000	Rs.000	%
ආදායම	209,485	183,900	162,509	137,556	130,152	25,585	13.91
දළ ලාභය	126,979	116,109	131,937	109,856	109,179	10,870	9.36
වෙනත් මෙහෙයුම් ආදායම	55,755	43,751	5,547	2,290	747	12,004	27.43
මූල්‍ය ආදායම	60,308	74,868	45,074	12,455	15,511	(14,560)	(19.45)
පරිපාලන වියදම්	84,651	70,632	58,776	43,506	60,070	14,019	19.84
බදු පසු ලාභය	366,648	125,701	97,426	58,865	36,015	240,947	191

බදු ගෙවීමෙන් පසු ලාභයේ සැලකිය යුතු වැඩිවීමක් වන්නේ ආයෝජන දේපළවල සාධාරණ වටිනාකම රු.269,517,245 කින් ඉහළ යාමයි.

2.3 අනුපාත විශ්ලේෂණය

විගණනයට ලබා දී ඇති මූල්‍ය ප්‍රකාශන සහ තොරතුරු අනුව, පසුගිය වසර පහ සඳහා වැදගත් අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

අනුපාතයන්		**2024**	**2023**	**2022**	**2021**	**2020**
දළ ලාභ අනුපාතය	(%)	60.61	63.13	81	79.9	83.9
යෙදවූ ප්‍රාග්ධනය මත වූ ප්‍රතිලාභය	(%)	24	15	9	6	4
ජංගම අනුපාතය		15:1	12:1	10:1	8:1	9:1
ක්ෂණික අනුපාතය		15:1	11:1	10:1	8:1	9:1
කොටසක ඉපැයුම (EPS)		4.21	1.44	1.12	0.68	0.43

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	සමාගමේ ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ වැලිපැන්න දක්ෂිණ අධිවේගී මාර්ග සේවා ප්‍රදේශයේ (ආකේඩ්) ඉඩ ප්‍රමාණයන් බදු දීමය. වර්ග අඩියකට කුලී ගාස්තු සහ සේවා ගාස්තු තීරණය කිරීම සඳහා සමාගම සම්මත හෝ ස්ථාවර ක්‍රමවේදයක් පවත්වා ගෙන ගොස් නොමැති බව නිරීක්ෂණය විය. තවද, මෙම වෙනස්කම් පාලනය කිරීම සඳහා සමාගම අනුමත ආදායම් අත්පොතක්, මාර්ගෝපදේශයක් හෝ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර නොමැත. තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව එකම කුලී නිවැසියන් සමඟ සෑම වසර පහකට වරක් බදු ගිවිසුම් අලුත් කර ඇති අතර සම්මත අනුපාත අදාළ කර නොමැත.	කල් ඉකුත් වූ වෙළඳසැල් කුලියට දීම සඳහා තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුව ලබා ගැනීමට කටයුතු කර ඇත.	වර්ග අඩියකට කුලිය සහ සේවා ගාස්තු අය කිරීමේ පදනම නිර්වචනය කරමින්, කළමනාකාරිත්වය නිසි ලෙස අනුමත කරන ලද ආදායම් අත්පොතක්/ප්‍රතිපත්තියක් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතුය.
(ආ)	කුලී නිවැසියෙකු සමඟ ඇති කරගත් බදු ගිවිසුමේ 9(z) වගන්තියට අනුව, බදුකරු	එකඟ වේ. මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක්	කල්බදු ගිවිසුමේ කොන්දේසි වලට අනුකූල

	විසින් සමාගමේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව එම පරිශ්‍රයේ තාවකාලික හෝ අර්ධ ස්ථිර ස්වභාවයේ කිසිදු අමතර සැකැස්මක් හෝ වෙනසක් සිදු නොකළ යුතුය. කෙසේ වෙතත්, මණ්ඩලයේ අනුමැතියකින් තොරව එක් වෙළඳසැලක් එම පරිශ්‍රයේ අතිරේක ස්ථිර ව්‍යුහයක් ඉදිකර ඇති බව නිරීක්ෂණය වූ අතර සමාගම මෙම කාරණය සුපරීක්ෂණය කර නොමැත.	නොතිබුණ අතර පරිශ්‍රය වෙනස් කිරීම සඳහා අනුමැතිය ලබාගෙන නොමැත. මෙය ගොඩනැගිල්ලට අගය එකතු කිරීමකි, නමුත් කළමනාකාරිත්වය තීරණයක් ගැනීම සඳහා මෙම කාරණය ඊළඟ විගණන කමිටු රැස්වීමට යොමු කරනු ඇත.	වීම අවශ්‍ය වේ.
(ඇ)	නඩත්තු සහ වායු සමීකරණ අලුත්වැඩියා සේවාව සඳහා විධිමත් සේවා ගිවිසුමකින් තොරව විවිධ සැපයුම්කරුවන්ගෙන් සේවා ලබා ගත් වායු සමීකරණ අලුත්වැඩියාවන් සඳහා රු.2,495,031 ක මුදලක් 2024 වර්ෂයේදී වැය කර තිබුණි. කෙසේ වෙතත්, දෙපැත්තෙහිම මධ්‍යගත වායු සමීකරණ පද්ධති සඳහා වියදම් කර තිබුණද ඵලදායී ලෙස ක්‍රියාත්මක නොවන බව විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	2013 දී ස්ථාපනය කරන ලද වායු සමීකරණ පද්ධතිය ආසන්න වශයෙන් වසර 12 ක් පැරණි වන අතර ප්‍රධාන අලුත්වැඩියාවන් අවශ්‍ය වේ. ආරක්ෂිත නඩත්තුව සඳහා SLIC සමඟ සාකච්ඡා සිදුවෙමින් පවතින අතර, අලුත්වැඩියා කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම තීරණය කිරීම සඳහා රජය සතු ව්‍යවසායයකින් පුළුල් වාර්තාවක් ලබා ගනු ඇත.	ප්‍රධාන දෝෂ සහ බාධාවකින් තොරව ක්‍රියාත්මක වීම සඳහා වායු සමීකරණ පද්ධතියේ නිතිපතා නඩත්තු කිරීම අවශ්‍ය වේ.
(ඈ)	සමාගමේ CCTV කැමරා පද්ධතිය කිසිදු නම් කරන ලද හෝ වගකිවයුතු නිලධාරියෙකු විසින් නිරීක්ෂණය කර නොතිබුණි. මෙය ඵලදායී ආරක්ෂක අධීක්ෂණ යාන්ත්‍රණයක් නොමැතිකම පිළිබිඹු කරන අතර පරිශ්‍රයේ සමස්ත ආරක්ෂාවට අවදානමක් ඇති කරයි. තවද, සමාගම විසින් මෙම CCTV පද්ධතිය සඳහා රු.4,665,820 ක මුදලක් වැය කර තිබුණද පද්ධතියට උපස්ථ පිටපත් කිරීමේ හැකියාවන්, විශ්වසනීයත්වය සහ කාර්යක්ෂමතාව නොතිබුණි.	CCTV පද්ධතිය නිරීක්ෂණය කිරීම සඳහා වගකිවයුතු පුද්ගලයින් වහාම පත් කරනු ලැබේ.	CCTV පද්ධතිය නිතිපතා අධීක්ෂණය කිරීම සහ ඕනෑම ආරක්ෂක සිදුවීමකට කාලෝචිත ප්‍රතිචාර දැක්වීම සහතික කිරීම සඳහා කළමනාකාරිත්වය වගකිවයුතු නිලධාරියෙකු පත් කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	කල්බදු ගිවිසුමක් නොමැතිව, සමාගම විදුලි වාහන ආරෝපණ මධ්‍යස්ථානයක් සඳහා වර්ග අඩි 630 ක භූමි ප්‍රමාණයක් බදුකරුට බදු දී තිබුණි. කෙසේ වෙතත්, සමාගම 2018 ජනවාරි 16 වන දින සිට	2025 ජූලි 24 වන දින පැවති මණ්ඩල රැස්වීමේදී සේවා ගිවිසුම අවසන් කර, පරීක්ෂණයක් සිදු කිරීමට තීරණය කර ඇති අතර, එහි	කළමනාකාරිත්වය වහාම කුලී නිවැසියා සමඟ නීත්‍යානුකූල කල්බදු ගිවිසුමක් විධිමත්ව ඇති

	බදුකරු සමඟ සේවා ගිවිසුමකට එළඹ ඇති අතර, දළ මාසික ආදායමෙන් සියයට 12 ක් ගෙවීමට බදුකරු එකඟ වී තිබුණි. ගිවිසුම්ගත දින සිට බදුකරු කිසිදු මාසික ආදායම් ප්‍රකාශනයක් ඉදිරිපත් කර හෝ සමාගමට අදාළ ගෙවීම් සිදු කර නොතිබුණි. 2018 ජනවාරි සිට සමාගමට කුලී ආදායම හෝ මාසික සේවා ආදායම ආසන්න වශයෙන් රු. 12,000,000 ක් අහිමි වී ඇත.	නිගමන මත පදනම්ව අතිරේක ක්‍රියාමාර්ග ගනු ඇත. එසේම, සේවා ප්‍රදේශයේ වාහන විදුලි ආරෝපණ ස්ථාන ඉදිකිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) අනුමැතිය ලබා දී නොමැති බැවින්, එම ව්‍යාපෘතිය අවසන් කර, බදු ගිවිසුමේ නියමයන්ට අනුව නැවත සලකා බැලීමට තීරණය කර ඇත.	කළ යුතුය.
(ආ)	පසුගිය මූල්‍ය වර්ෂ තුන තුළ සබ්වේ ෆ්‍රැන්චයිස් මෙහෙයුම් ක්‍රියාකාරකමෙන් සමාගම අඛණ්ඩ ශුද්ධ පාඩු ලබා ඇති අතර එය 2022 දී රු.2,517,521 ක්, 2023 දී රු.7,694,948 ක් සහ 2024 දී රු.8,429,823 ක් විය. මෙම නැවත නැවත සිදුවන පාඩු වලින් පෙන්නුම් කරන්නේ ෆ්‍රැන්චයිස් ක්‍රියාකාරකම සමාගමට මූල්‍යමය වශයෙන් තිරසාර නොවන බවයි.	සමාගම විගණන නිරීක්ෂණය පිළිගෙන ඇති අතර, සබ්වේ හි සම්මත මෙනුව නිසා ලාභ ප්‍රමාණය සීමිත වන බව අවධාරණය කර ඇත. 2025 ජූනි මාසයේ ආරම්භ කළ නව බජට් පැක් එක හේතුවෙන් 2025 ජූලි මාසයෙන් ආරම්භව ආදායම වැඩි වී ඇති අතර අලෙවිසැල ලාභදායී කිරීම සඳහා සමීප අධීක්ෂණයක් ක්‍රියාත්මක වේ. වාර්තා වූ පාඩු අතර වාර්ෂික කුලී වියදම් රු.මිලියන 7 ක් ද ඇතුළත් වේ.	සබ්වේ ෆ්‍රැන්චයිස් දිගටම කරගෙන යාමේ මූල්‍ය ශක්‍යතාව පිළිබඳව කළමනාකාරිත්වය විවේචනාත්මකව ඇගයීමට ලක් කළ යුතු අතර තවදුරටත් පාඩු අවම කිරීම සඳහා විකල්ප උපාය මාර්ග සලකා බැලිය යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආකේඩ්හි ඉහළ මහලේ ඇති මුළු වර්ග අඩි 24,339 න් වර්ග අඩි 6,696 ක් කුලියට දීම සඳහා වෙන් කර තිබුණු අතර, වර්ග අඩි 17,643 ක් මුල් අරමුණ වූ හරිත සංකල්පයට අනුව ගස් රෝපණය සිදුකර සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ආකේඩ් හි මෙහෙයුම් ආරම්භ කළ දා සිට සමාගම මෙම අවකාශයන් භාවිතා කර නොමැති වීමෙන් ව්‍යාපෘතියේ මූලික පාරිසරික තිරසාර අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වී ඇති අතර අවකාශයන්ගෙන් ලැබෙන කුලී ආදායම අහිමි වී ඇත.	2018 ට පෙර ඉහළ මහල ප්‍රදේශය අවන්හල් සඳහා කුලියට දී තිබුණි. කෙසේ වෙතත්, ඉහළ මහලට පාරිභෝගිකයින්ගේ පැමිණීම අඩු වීම නිසා කුලීකරුවන් ස්ථානය අත්හැර ගොස් ඇත. මූලික සැලැස්ම සමාලෝචනය කරනු ලබන අතර, සේවා ප්‍රදේශයේ අනාගත සංවර්ධනයත් සමඟ මූලික සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබේ.	හිස් අවකාශය ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා කළමනාකාරිත්වය විකල්ප උපාය මාර්ග සොයා බැලිය යුතුය.

(ආ)	2018 දී මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) විසින් ආකේඩ් හි LED පුවරු දෙකක් ස්ථාපිත කර තිබුණි. එහෙත්, මෙම පැනල් පසුගිය වසර හත තුළ ක්‍රියාත්මක නොවී පැවතුනි. RDA වෙතින් කල්බදු කුලිය එකතු කිරීමට හෝ මෙම වත්කම්වල අයිතිය සමාගමට පැවරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, පැනල් තෙවන පාර්ශවයකට බදු දීමෙන් අමතර ආදායමක් උපයා ගැනීමේ අවස්ථාව අහිමි වී ඇත.	කැනොවින් කළමනාකාරිත්වයේ අනුමැතියකින් තොරව LED පැනල් දෙකක් ඉදිකරන ලදී. පසුව ඒවා ඉඩම් සමීක්ෂණයකට යටත්ව RDA සතු ඉඩමකට මාරු කිරීමට RDA සමඟ එකඟ වූ අතර ඒ සඳහා සභාපතිවරයා අවසර ලබා දී ඇත.	මෙම ගැටළුව ප්‍රමාදයකින් තොරව විසඳීමට කළමනාකාරිත්වය වහාම පියවර ගත යුතුය.
(ඇ)	ආකේඩ් දෙපස පිහිටා ඇති ATM ස්ථාන හතරක් හිස්ව පවතින බවත් 2025 සැප්තැම්බර් 30 දින වන විට සමාගම විසින් බදු දී නොමැති බවත් නිරීක්ෂණය විය.	හිස් අවකාශයන්හි ATM/CRM යන්ත්‍ර ස්ථාපනය කරන ලෙස බැංකු දෙකකින් ඉල්ලා සිටියේය. එක් බැංකුවකට එය ලබා දිය නොහැකි බව දන්වා ඇති අතර, අනෙක් බැංකුව නව CRM යන්ත්‍ර තාපයට සංවේදී බවත් අඛණ්ඩ වායු සමීකරණයක් අවශ්‍ය බවත් දැනුම් දී ඇති අතර පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කරන අතරතුර සාමාන්‍ය නඩත්තු කටයුතු සිදු කරන බවට සහතික විය.	හිස් ATM අවකාශයන් බදු දීමට කළමනාකාරිත්වය කඩිනම් පියවර ගත යුතුය.
(ඈ)	2024 වර්ෂය තුළ සමාගම විසින් අවස්ථා දෙකකදී ජල ටැංකි 12 ක් මිලදී ගෙන ඇති අතර, ඒ සඳහා මුළු පිරිවැය රු. 1,728,000 කි. කෙසේ වෙතත්, 2025 ජූලි 25 දින විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ පරිදි, මෙම ජල ටැංකි භාවිතා කර නොමැත.	සමාගමේ මෙම වත්කම් ඵලදායී ලෙස භාවිතා කිරීමට පියවර ගනු ලැබේ.	සමාගමේ සම්පත් ඌන උපයෝජනය අවම කිරීම සඳහා ප්‍රසම්පාදනය කරන ලද වත්කම් කාර්යක්ෂමව භාවිතා කරන බවට කළමනාකරණය සහතික විය යුතුය.

3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.1 ඡේදයට අනුකූලව සමාගම ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.	2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කෙරෙමින් පවතී.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව පුළුල් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර අනුමත කර ඇති බවට කළමනාකාරිත්වය සහතික විය යුතුය.

(ආ)	2024 වර්ෂය සඳහා ප්‍රසම්පාදන කමිටුවක් පත් කිරීමේ ලිපි ඉදිරිපත් කර නොතිබුණි. එවැනි පත්කිරීමක් නොමැති විට, වර්ෂය තුළ ගනු ලැබූ ප්‍රසම්පාදන තීරණ නිසි ලෙස පිහිටුවන ලද ප්‍රසම්පාදන කමිටුවක් විසින්ගෙන නොමැත. එබැවින්, පවතින ප්‍රසම්පාදන රෙගුලාසි අනුව එම ප්‍රසම්පාදන තීරණ වලංගු යැයි සැලකිය නොහැකිය.	අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ප්‍රසම්පාදන කමිටුවක් පත් කිරීමට පියවර ගනු ලැබේ.	ප්‍රසම්පාදන කමිටුවක් පත් කිරීම නිසි ලෙස ලේඛනගත කර තබා ගත යුතුය.
(ඇ)	සමාගම රු. 17,162,844 ක ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 10 ක් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.4.3(d), 4.3.1(a), 5.2.1(a), 5.3.1(a), 6.3.5, 6.3.6, 7.11.1 ඡේද අනුගමනය කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය ක්‍රියාත්මක කිරීමට පියවර ගනිමින් පවතී. සියලුම වගකිවයුතු නිලධාරීන් පැහැදිලි කිරීම් සඳහා කැඳවනු ලබන අතර, සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ.	ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඈ)	2023 දෙසැම්බර් 12 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, ආකේඩ්හි දෙපැත්තම ආවරණය වන පරිදි CCTV කැමරා පද්ධති දෙකක් ස්ථාපනය කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. එහෙත්, පිළිගැනීමේ ලිපිය නිකුත් කිරීමකින් තොරව, පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු විසින් ස්ථාපන කටයුතු ආරම්භ කර තිබුණි. ආකේඩ් A පැත්තේ CCTV කැමරා ස්ථාපනයට අදාළ ගිවිසුම 2023 දෙසැම්බර් 20 වන දින අත්සන් කරන ලද නමුත් එහි කොන්ත්‍රාත් වටිනාකම නිශ්චිතව දක්වා නොතිබුණි. විශේෂයෙන්ම, 2024 පෙබරවාරි 29 දින තාක්ෂණික ඇගයීම් කමිටු (TEC) වාර්තාව ඉදිරිපත් කරන විටත් A පැත්තේ කැමරා පද්ධතිය ස්ථාපනය අවසන් කර තිබුණි.	අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි, 2023 දෙසැම්බර් 12 වන දින සිට වැඩ ආරම්භ කරන ලදී. ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ නොකර කිසිදු සම්මාන ලිපියක් නිකුත් නොකරන ලෙස ප්‍රසම්පාදන අංශයට උපදෙස් ලබා දෙන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දුන් උපදෙස් අනුව, ප්‍රසම්පාදන නිලධාරියා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාධාරණීකරණය සහ නිර්දේශයට තොරතුරු ඇතුළත් කර ඇත.	විධිමත් ලිඛිත ගිවිසුමකින් තොරව සැපයුම්කරුවන් සේවයට අනුයුක්ත නොකිරීමට කළමනාකාරිත්වය තහවුරු කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා නිසි ලෙස සම්පූර්ණ කර, ලේඛනගත කර, රඳවා තබා ගැනීම සමාගම විසින් කළ යුතුය.
(ඉ)	2023 දී ආකේඩ් හි අපජල පවිත්‍රාගාර අලුත්වැඩියා කිරීම සඳහා සමාගම ලංසු කැඳවා තිබුණි. එහෙත්, එක් ලංසුවක් පමණක් ලැබී ඇති අතර අතර එය ඇගයීමට ලක් කර නොතිබුණි. පසුව, 2024 මාර්තු 19 දින, එම කොන්ත්‍රාත්කරුගෙන්ම රු.4,243,280 ක යාවත්කාලීන මිලක් ලබාගෙන, වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ඇගයීමට ලක් කර තිබුණි. කොන්ත්‍රාත්තුව පසුව ඇගයීමට ලක් කළ කොන්ත්‍රාත්කරුට රු.500,000 ක මිලකට ප්‍රදානය කර	"පිරිසිදු ජල පද්ධතිය" විසින් සපයන ලද මිල ගණන් මගින් වැඩ විෂය පථය ආවරණය කර ඇති බව සහකාර ඉංජිනේරුවරයා තහවුරු කර ඇති අතර, මිලදී ගැනීමේ ඉල්ලීමක් හරහා අපජල පිරිපහදු යන්ත්‍රවලට සේවා සැපයීම සඳහා ඉහත සමාගම තෝරා ගැනීමට නිර්දේශ කර තිබුණි.	සමාගම ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල විය යුතුය.

	තිබුණි. කෙසේ වෙතත්, 2025 ජූලි 25 වන දින විගණන පරීක්ෂණයේදී අලුත්වැඩියා කරන ලද අපජල පවිත්‍රාගාරය ක්‍රියාත්මක නොවන බවත්, පිරිපහදු නොකළ අපජලය පරිසරයට මුදා හරින බවත් නිරීක්ෂණය විය.		

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 හි 3.2. (i) වගන්තියට අනුව, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ අදාළ අමාත්‍යාංශයේ නිර්දේශ සමඟ කාර්ය මණ්ඩල තත්ත්වය සහ බඳවා ගැනීමේ පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, සමාගම විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	2022 මැයි 18 දිනැති ලිපියට අනුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සඳහන් කරන්නේ අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් සුදුසු තීරණ ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ඇති බවයි. කෙසේ වෙතත්, අවශ්‍ය යැයි සලකනු ලැබුවහොත්, අනාගතයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගනු ඇත.	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුකූල විය යුතුය.
(ආ)	සමාගම විසින්, 2016 ඔක්තෝබර් 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2015(i) ට පටහැනිව, 2020 අප්‍රේල් මාසයේ සිට මසකට රු.50,000 ක අමතර වාහන දීමනාවක් සමාගමේ සභාපතිවරයාට ගෙවා ඇති අතර 2024 අප්‍රේල් මාසයේ සිට රු.50,000 කින් එය වැඩි කර ඇත. ඒ අනුව, මුළු වාහන දීමනාව රු.3,300,000 ක් භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.	වාහන දීමනාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. වත්මන් සභාපතිවරයාට සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට ගෙවනු ලබන්නේ 2020 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2020 හි නිශ්චිතව දක්වා ඇති සීමාවන් තුළ පමණි.	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලට අනුකූල විය යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 සංයුක්ත සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල 2.3 ඡේදයට	සමාගමේ සංයුක්ත සැලැස්ම සකස් කිරීමට නියමිතය.	අනාගත කාලපරිච්ඡේදය තුළ මෙම ප්‍රධාන සැලසුම් ලේඛන කාලෝචිත ලෙස

අනුව රජය සතු ව්‍යවසායන් වත්මන් වර්ෂය ඇතුළුව සංයුක්ත සැලැස්ම සකස් කළ යුතු වුවද, සමාගම සමාලෝචිත වර්ෂය සඳහා සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි.		සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සහතික කිරීමෙන් සමාගම ආයතනික පාලන රාමුවට අනුකූල වීමට වහාම පියවර ගනී.

4.2 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයෙහි 4.4 ඡේදයට අනුව රජය සතු ව්‍යවසායන් සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කළ යුතු වුවද, සමාගම අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොමැති අතර මව් සමාගමේ අභ්‍යන්තර විගණන කාර්යය යටතේ ද ආවරණය කර නොතිබුණි.	කැනොවින් හෝටෙල් ඇන්ඩ් ස්පාස් (පුද්ගලික) සමාගමේ අභ්‍යන්තර විගණන කටයුතු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ විගණන කාර්ය මණ්ඩලයට පවරා ඇත. අනාගතයේදී වරින් වර අභ්‍යන්තර විගණන සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ විගණන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කිරීමට අපි අවශ්‍ය පියවර ගන්නෙමු.	නියමිත පාලන අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.

4.3 විගණන කමිටුව

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
රාජ්‍ය ව්‍යවසායන් සඳහා ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ (SOE) හි 4.2 ඡේදයේ (එච්) වගන්තියට අනුව විගණන කමිටුව (AC) අවම වශයෙන් මාස තුනකට වරක්වත් රැස්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබුණේ එක් රැස්වීමක් පමණි.	මව් සමාගම නියෝජනය කරන විගණන කමිටු (AC) සාමාජිකයෙකු 2024 අගෝස්තු මාසයේදී ඉල්ලා අස්වී ඇත. එසේම, අධ්‍යක්ෂ මණ්ඩලය 2025 ජනවාරි මාසයේදී සමාගමෙන් ඉල්ලා අස්විය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විගණන කමිටුවට නව සාමාජිකයෙකු පත් කර ඇති අතර අනෙකුත් අධ්‍යක්ෂවරුන් පත් කිරීමෙන් පසු හැකි ඉක්මනින් විගණන කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු සූදානම් වෙමින් පවතී.	නියමිත පාලන අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.

4.4 පාරිසරික ගැටලු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගම නිසි අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතියක් පවත්වා ගැනීමට අපොහොසත් වී ඇති බවත්, එහි පරිශ්‍රය තුළ අපද්‍රව්‍ය බැහැර කරන බවත් නිරීක්ෂණය විය. මේ හේතුවෙන් ආකේඩ් ප්‍රදේශය අවිධිමත් හා අපිරිසිදු බවක් අප්‍රසන්න ගන්ධයන් පැතිර යාමක් සිදු වී ඇත.	සේවා ප්‍රදේශයේ දෛනික භාවිතය ඉහළ මට්ටමක පැවතීම නිසා, සමාගම නිසි ලෙස එසේ කිරීමට උත්සාහ කළද, අපද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම වෙන් කිරීම අභියෝගාත්මක ය. කෙසේ වෙතත්, බැහැර කිරීමේ අංගනයක් නොමැති බව පවසමින් මතුගම ප්‍රාදේශීය සභාව නැවත නැවතත් අපද්‍රව්‍ය එකතු කිරීම ප්‍රතික්ෂේප කර ඇත. අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ (WMA) මඟ පෙන්වීම අනුගමනය කරමින්, සමාගම නිර්දේශිත පෞද්ගලික එකතුකරන්නන්ගෙන් මිල ගණන් ලබාගෙන එකක් තෝරා ගත්තේය. WMA හි සහාය ඇතිව ක්‍රමානුකූල අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියාවලියක් දැන් ක්‍රියාත්මක වේ.	කළමනාකරණය විසින් නිසි එකතු කිරීම, වෙන් කිරීම සහ බැහැර කිරීම සහිත ඵලදායී අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය.